මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
மஹாபொல உயர்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்
MAHAPOLA HIGHER EDUCATION SCHOLARSHIP TRUST FUND

4 වන මහල, ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, 191, ධර්මපාල මාවත, කොළඹ 07, ශ්‍රී ලංකා.
4ஆம் மாடி ,ஜே.ஆர்.ஜயவர்தன நிலையம்,191,தர்மபால மாவத்தை,கொழும்பு 07.
4TH Floor, J.R. Jayewardene Centre, 191, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.


මගේ අංකය / எனது இல / My No. MTF/1/3(II)

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2019.02.11

1. උපකුලපති,
   කොළඹ, පේරාදෙණිය, කැලණිය, ශ්‍රී ජයවර්ධනපුර, මොරටුව, යාපනය, රුහුණ, නැගෙනහිර, අග්නිදිග, සබරගමුව, රජරට, වයඹ, ඌව වෙල්ලස්ස, සෞන්දර්ය කලා

2. අධ්‍යක්ෂ,
   ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක පාසල, ස්වාමී විපුලානන්ද ආයතනය

3. මණ්ඩපාධිපති,
   ශ්‍රී පාලි මණ්ඩපය, නැගෙනහිර විශ්ව විද්‍යාලය (ත්‍රිකුණාමල මණ්ඩපය), යාපනය විශ්ව විද්‍යාලයේ වවුනියා මණ්ඩපය

මහත්මයාණෙනි,

<u>මහපොළ ශිෂ්‍යත්ව මාසික වාරික ගෙවීම් ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කිරීම.</u>

2018 ජූලි 13 වන දින පැවති 68 වන භාරකාර මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණයක් අනුව මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මාසික ශිෂ්‍යත්ව වාරික ගෙවීම ඉතා කඩිනමින් වේගවත්ව නිශ්චිත දිනයකදී ප්‍රමාදයකින් තොරව ශිෂ්‍යත්වලාභීන්ට ගෙවීම සඳහා පවතින ගෙවීම් ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය කරන ලදී. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති, උප සභාපති, ලේකම් සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ භාරකරුවෙකු වන එස්.වී.ඩී.කේසරලාල් ගුණසේකර මහතා හා එහි අධ්‍යක්ෂවරයා අතර 2018.08.01 දින පැවති සාකච්ඡාවට අනුව ඉහත ශිෂ්‍යත්ව වාරික ගෙවීම් ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය කරන ලදී. මේ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ද ලැබී ඇති අතර ගෙවීම් ක්‍රියාවලිය ප්‍රතිව්‍යූගත කිරීම පහත සඳහන් පරිදි සිදුකෙරෙනු ඇත.

1. දැනට මාසික ශිෂ්‍යත්ව වාරික ගෙවීම සඳහා සිසුන්ගෙන් ලබාගන්නා අත්සන් ලේඛණ ඉවත් කිරීමටත් ඒ සඳහා ශිෂ්‍යත්වලාභීන්ගේ මාසික ගෙවීම් සම්බන්ධ විශ්වවිද්‍යාල උපකුලපතිවරයා විසින් නිර්දේශිත නම් ලැයිස්තුවක් ලබාගෙන අදාල වාරික ගෙවීම සිදුකිරීම.

   මෙහිදී උපකුලපතිවරයා විසින් අදාල මාසික වාරිකය ශිෂ්‍යත්වලාභියා වෙත නිදහස් කිරීමට නිර්දේශ කරන අතර, එම නිර්දේශය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලබාදේ. ඒ අනුව එම මාසයට අදාල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ලබාදෙන කොටස සෘජුවම මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත බැර කරනු ලැබේ. ඉන් අනතුරුව මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් ශිෂ්‍යත්වලාභියාට හිමි වාරිකයකට අදාල මුළු මුදල රු.5000/- හෝ රු.5050/- වනසේ ඒ ඒ ශිෂ්‍යත්වලාභියාගේ බැංකු ගිණුම් වෙත සෘජුවම බැර කරන අතර වාරික ගෙවීම් සම්බන්ධව විශ්වවිද්‍යාලය මැදිහත් වීමක් සිදුනොවේ.

2. මෙම නව ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේදි පහත සඳහන් කරුණු කෙරෙහි විශ්වවිද්‍යාල විශේෂ අවධානය යොමුකල යුතුවේ. ඒ අනුව අදාල කාර්යය මණ්ඩල දැනුවත් කරන ලෙසද ඉල්ලමි.


දුරකතන/தொலைபேசி/Tel: 0112685011, ෆැක්ස්/பெக்ஸ்/Fax: 0112685548, Web : www.mahapola.lk, Email : mahapola@mahapola.lk



1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත යටතේ ස්ථාපිතයි. மஹாபொல உயர்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியமானது 1981 ஆம் ஆண்டின் 66 ஆம் இலக்க சட்டத்தினால் தாபிக்கப்பட்டதாகும். Established under Mahapola Higher Education Scholarship Trust Fund Act No.66 of 1981.

විශ්වවිද්‍යාල විසින් තහවුරු කරන ලද නාම ලේඛණ සෑම අතින්ම නිවැරදි හා සම්පූර්ණ විය යුතු අතර, මුළු ශිෂ්‍ය සංඛ්‍යාව හා එහි වෙනස්වීම් පසුගිය මාසය සමඟ සැසඳුම් වාර්තාවක් මඟින් ඉදිරිපත් කළයුතු වේ. ( මෙහිදී ශිෂ්‍ය සංඛ්‍යාව දැක්වීමේදී කුසලතා හා සාමාන්‍ය ශිෂ්‍යත්වලාභීන් ලෙස වෙන වෙනම සිසුන් සංඛ්‍යාව දක්වනු මැනවි.) මෙම සිසුන්ගේ නාම ලේඛණය මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් E-mail මඟින් එවනු ලබන ශිෂ්‍යත්ව නාම ලේඛණයේ අනුපිළිවෙලටම සකස්කර ( නාම ලේඛණයේ සඳහන් අනුපිළිවෙල වෙනස් නොකළයුතු වේ.) අවසන් නාම ලේඛණය ශිෂ්‍ය සේවා අංශය විසින් සකස් කළයුතු වේ. මෙම නාමලේඛණය සකස් කිරීමේදී මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ගෙවීම් කොන්දේසි වලට අනුකූල වන පරිදි සකස් කළයුතු වේ. එම ගෙවීම් නිර්ණායකයන්ට අනුව හා ශිෂ්‍යත්ව වාරික නැවැත්වීම හා අහෝසි කිරීම පහත සඳහන් කරුණු මත සිදුකළ යුතුවේ.

- සෑම ශිෂ්‍යත්වලාභියෙකුම නියමිත අධ්‍යයන කටයුතු වලට සහභාගිවීමේ ප්‍රතිශතය 80% විය යුතුවේ. එසේ නොවන අවස්ථාවල ගෙවීම් නිර්දේශ නොකල යුතුවේ
- අදාල මාසය තුල පහත සඳහන් හේතූන් මත සිසුන්ගේ අධ්‍යයන කටයුතු තාවකාලිකව නවතා ඇත්නම්, එම සිසුන්ගේ වාරික ගෙවීම සඳහා නිර්දේශ නොකල යුතුය.

    I. විනය විරෝධි ක්‍රියා හේතුන් මත පන්ති තහනම් කිරීම.
    II. විශ්ව විද්‍යාල දේපල වලට හානි සිදු කිරීම හා ඒ මත දඬුවම් ලැබීම.
    III. නවක වදය සම්බන්ධයෙන් දඬුවම් ලැබීම.
    IV. අපචාර සිද්ධීන්ට සම්බන්ධවීම හා ඒ මත දඬුවම් ලැබීම.

ඉහත කරුණු සම්බන්ධයෙන් අදාල සිසුන්ගේ නාම ලේඛණය වෙනමම මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත ඉදිරිපත් කළයුතු වේ. ඒ අනුව ඔවුන්ගේ ශිෂ්‍යත්ව වාරික ගෙවීම් වහාම අත්හිටුවන අතර, ශිෂ්‍යත්වය අහෝසි කිරීම සම්බන්ධයෙන් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල තීරණය කරණු ඇත.

අවසන් නිර්දේශිත නාම ලේඛණය සකස් කිරීමේදි පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගත යුතු වේ.

- විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව සඳහා අධ්‍යයන වර්ෂයකට වාරික 10ක උපරිමයකට යටත්ව පාඨමාලාවට නියමිත අධ්‍යයන වර්ෂ ගණන සඳහා පමණක් ශිෂ්‍යත්ව වාරික ගෙවනු ලැබේ. ( මෙහිදී පෙර පරිදි මාසික වාරික ඉල්ලීම කල යුතුවේ.)

- පාඨමාලාව පැවැත්වෙන කාලය තුලදී මසකට එක් ශිෂ්‍යත්ව වාරිකය බැගින් පමණක් ශිෂ්‍යයා ඉගෙනුම ලබන විශ්ව විද්‍යාලවලදී ගෙවනු ලැබේ. යම් ශිෂ්‍යත්වලාභියෙකුට ගෙවිය යුතු හිඟ වාරික තිබේ නම් ඔහු/ඇය පාඨමාලාව ආරම්භයේ සිට අධ්‍යයන කටයුතුවලට නිරතවීම තහවුරු කර අදාල මාස සමඟ ගෙවිය යුතුව ඇති හිඟ වාරික ගණනද සමඟ ගෙවීම් නිර්දේශය එවිය යුතුවේ.

- මෙම ශිෂ්‍යත්ව භාර ගැනීමෙන් පසුව මෙම පාඨමාලාව හෝ වෙනත් පාඨමාලාවකට හෝ වෙනත් කිසිදු ශිෂ්‍යත්වයක් හෝ ශිෂ්‍යාධාර ලබාගැනීමට අවසරය නැති අතර, වෙනත් ශිෂ්‍යත්වයකට හිමිකම් ලබන ශිෂ්‍යයෙකු ඔහුට/ඇයට මනාපය පරිදි පළමු ශිෂ්‍යත්වයේම පමණක් රැඳී සිටීම හෝ පළමු ශිෂ්‍යත්වය අවලංගු කර නව ශිෂ්‍යත්වය ලබාගැනීම හෝ සිදුකළ හැකිය. මෙවැනි තොරතුරු අප්‍රමාදව විශ්වවිද්‍යාලය විසින්

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත වාර්තා කළයුතු වේ. ඒ අනුව අදාල අවසන් නිර්දේශය අනුව ගෙවීම් ලේඛණ සැකසිය යුතුය.

- ශිෂ්‍යත්වය සඳහා තෝරී ඇති පාඨමාලාව වෙනුවට වෙනත් පාඨමාලාවක් හැදෑරීම, පාඨමාලාවට සහභාගී නොවීම, දීර්ඝකාලීනව පාඨමාලාවට සහභාගී නොවීම, වාර්ෂික විභාග අසමත් වීම, පාඨමාලාව අත්හැරීම, ආදී කරුණු ශිෂ්‍යත්වය අවලංගු වීමට හේතු වේ.

- ආදායම් ලැබීම පිණිස ව්‍යාපාරයක ,සේවයක හෝ රැකියාවක නියුක්ත වීම යන හේතුද ශිෂ්‍යත්වය අවලංගු වීමට හේතුවන බැවින්, ඒ පිළිබඳව ද විශ්වවිද්‍යාලය දැනුවත් වූ වහාම මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත වාර්තා කළයුතු වේ.

- ශිෂ්‍යයාගේ පාලනයෙන් බැහැර වූ නොවලැක්විය හැකි හේතූන් මත ශිෂ්‍යයා විසින් අධ්‍යයන වර්ෂය කල් ලබා ගන්නා අවස්ථාවේදී ඒ පිළිබඳව විශ්වවිද්‍යාලය විසින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත වාර්තා කළයුතු වේ.

- විශ්වවිද්‍යාලන්තර මාරුවීම්, අභියාචනා කමිටු තීරණ මත ශිෂ්‍යත්ව ලබාදීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ශිෂ්‍යත්ව සඳහා තෝරීමේදී ලබාදිය යුතු තොරතුරු නියමිත පරිදි නොලැබීම මත ශිෂ්‍යත්වයක් සඳහා නිර්දේශ නොවූ සිසුන්ට අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් පසු ශිෂ්‍යත්ව ලබාදීම වැනි අවස්ථාවන්හිදී සිසුන්ගේ නම් අලුතින් ඇතුලත් කර ගෙවීම් කටයුතු සිදු කිරීම.

- ශිෂ්‍යත්ව ප්‍රදානයේදී ශිෂ්‍යත්ව සහතිකය ලබා නොගත් සිසුන්ගේ නැවත වාරික ගෙවීමේදී හිඟ සමඟ වාරික මුදා හැරීම නිර්දේශ කිරීම.

- විශේෂවේදී සිසුන්ගේ නාම ලේඛණ විශ්වවිද්‍යාලය මඟින් ලබා ගෙන විශේෂවේදී වසරට තවත් වාරික 10 ක් වනසේ වාරික ගලපා එම සිසුන්ගේ වාරික ගෙවීම සිදුකළ යුතුවේ. එම සියලු ගැලපීම් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් සිදුකරන අතර, එයට අදාල නිවැරදි නාමලේඛණය සෑම මසකම නිර්දේශිත නාමලේඛණය සමඟ ඉදිරිපත් කළයුතුය.

- ප්‍රායෝගික පුහුණු පාඨමාලා සඳහා සහභාගී වන සිසුන්ගේ වාරික ගෙවීමේදී ඔවුන්ගේ නම් ගෙවීම් අදාල මස මහපොළ සඳහා නිර්දේශ කරනු ලබන නාම ලේඛණයට ඇතුලත්ව සිටිය යුතු අතර එම සිසුන්ගේ නාම ලේඛණය පෙර එවූ පරිදි ලේඛණය මඟින්ද වෙනම ද එවිය යුතුවේ.

- සිසුන් ඉගෙනුම ලබන පාඨමාලාවට සමගාමීව විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත විදේශ ශිෂ්‍යත්වයක් ලබා ඇතිවිට පළමුව ගෙවීම් අත්හිටුවීම හා නැවත අධ්‍යයන කටයුතුවලට පැමිණි පසු ගෙවීම් සක්‍රීය කිරීම අදාල ලේඛණ මඟින් දැන්විය යුතුවේ.

- අභියාචනා මත හෝ ප්‍රමාදවී ශිෂ්‍යත්වයකට හිමිකම් ලබන ( Pending Settled Student ) හා අධ්‍යයන වර්ෂය කල් ගන්නා සිසුන් වැනි අලුතින් පැමිණෙන සිසුන්ගේ බැංකු ගිණුම් තොරතුරු අප වෙත දැන්වීමට කටයුතු කිරීම.

3. ඉහත කරුණු සැලකිල්ලට ගෙන අවසන් ගෙවීම් නිර්දේශිත නාමලේඛණය විශ්වවිද්‍යාලය විසින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත එවිය යුතු වේ. ( අදාල

නිර්දේශිත ගෙවීම් නාම ලේඛණ පිළියෙල කලයුතු ආකාරය හා එම ලේඛණවල සැසඳුම් වාර්තාව මේ සමඟ ඇමුණුම් අංක A ලෙස දක්වා ඇත.) එම ගෙවීම් නාමලේඛණ පදනම් කරගෙන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් අවසන් ගෙවීම් ලේඛණ සකස් කොට නැවත විශ්වවිද්‍යාලය වෙත යොමු කරනු ලැබේ. එහිදී විශ්වවිද්‍යාල විසින් අනුමත කරනු ලබන නාමලේඛණ වලට අදාල සිසුන් සඳහා ශිෂ්‍යත්ව ගෙවීම් පරීක්ෂාකොට එම අවසන් ගෙවීම් ලේඛණ වලට අදාල අවසන් ගෙවීම් නිර්දේශය විශ්වවිද්‍යාලය මඟින් මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලට පිටපතක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කළයුතු වේ. ඒ අනුව නිර්දේශිත ගෙවීම් ලේඛණයට අදාල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දායකත්වය මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත බැර කරනු ලැබේ. මේ සඳහා වන මහා භාණ්ඩාගාරයේ අනුමැතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් දැනටමත් ලබාගෙන ඇති බව දන්වා ඇත.

මෙම ක්‍රියාවලිය සඳහා වන කාල රාමුව පහත සහන් පරිදි වේ.

I. සෑම මසකම **20** වන දිනට හෝ ඊට පෙර අදාල ගෙවීම් නිර්දේශිත ශිෂ්‍යත්වලාභීන්ගේ නාම ලේඛණය මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත එවීම. (මෙහිදී සිසුන්ගේ ගෙවීම් අත්හිටුවීම් හෝ ගෙවීම් ආරම්භ කිරීම් වැනි තොරතුරු සෑම මසකම **15** දින වනවිට අවසන් කර ගැනීමට ඔබ විසින් කටයුතු කළයුතු වේ.)

II. අධ්‍යයන කටයුතු සඳහා සහභාගීත්වය 80% ගණනය කිරීමේදි පසුගිය මාසයට අදාල **01** සිට **30** දක්වා කාලය සැලකිය යුතුය. උදාහරණ වශයෙන් අගෝස්තු මස වාරිකය ගෙවීම සඳහා ජුලි 01 සිට ජුලි 30 කාලය සැලකිය යුතුය.

III. සෑම මසකම **30** වන දින අදාල අවසන් ගෙවීම් ලේඛණ මහපොළ අරමුදල විසින් විශ්වවිද්‍යාලය වෙත යොමුකරන අතර එම ගෙවීම් ලේඛණ විශ්වවිද්‍යාලය විසින් පරීක්ෂාකොට නිර්දේශිත ගෙවීම් ලේඛණය (Certified Payment List) ගෙවීම් කරන මස **05** වැනි දිනට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යැවිය යුතුය.

IV. විශ්වවිද්‍යාල මගින් නිර්දේශිත ගෙවීම් ලේඛණ වලට අනුව මාසික ශිෂ්‍යත්ව වාරිකයට අදාල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දායකත්ව කොටස ගෙවීම් කිරීමට නියමිත මස **12** වන දින මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත මාරු කිරීමට කටයුතු කරනු ඇත.

V. සෑම මසකම **15** වන දින මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් නිර්දේශිත ගෙවීම් ලේඛණයේ සඳහන් එක් එක් ශිෂ්‍යත්වලාභියාගේ මාසික ශිෂ්‍යත්ව වාරිකය ඔවුන්ගේ බැංකු ගිණුම් වෙත සෘජුවම බැර කරන අතර, එම ගෙවීම් කෙටි පණිවිඩයක් (SMS) මගින් අදාල ශිෂ්‍යත්වලාභියාට එම මොහොතේම දන්වනු ලැබේ. මෙම මුළු ක්‍රියාවලිය සඳහාම දින **25** වැනි කාලයකදි අවසන් කිරීමට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල බලාපොරොත්තු වන අතර ඒ සඳහා ඔබ විශ්වවිද්‍යාලයේ සහයෝගය අත්‍යාවශ්‍ය වේ. දැනට ක්‍රියාත්මක වන ගෙවීම් ක්‍රමය අනුව අත්සන් ලේඛණ භාවිතා කිරීමේදි ගෙවීම් ක්‍රියාවලිය සඳහා දින 40 ක් හෝ 50ක කාලයක් ගතවේ.

මෙම නව ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ කටයුතු පහසු වනු ඇත.

I. මහපොළ මාසික ශිෂ්‍යත්ව වාරික ගෙවීම් සම්බන්ධ නිශ්චිත දින තීරණය කොට ඇති බැවින්, සිසුන්ට ඒ පිළිබඳව විශ්වවිද්‍යාල මගින් ශිෂ්‍ය සංගම් හරහා දැනුවත් කිරීමට අවශ්‍ය නොමැත. එම සියලු තොරතුරු මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ වෙබ් අඩවිය මඟින් සිසුන්ට ලබාගත හැකිවේ.

II. අත්සන් ලේඛණ ක්‍රියාත්මක නොවීම මඟින් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ මහපොළ ශිෂ්‍යත්ව වාරික ගෙවීම් ක්‍රියාවලිය ඉතා සරල වීමෙන් හා පහසු වීමෙන් අනෙකුත් ශිෂ්‍ය සුභසාධනය සඳහා එම කාලය යොදා ගැනීමට හැකිවේ.

III. නියමිත පරිදි නිර්දේශිත නාම ලේඛණ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත එවා ඇත්නම් මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් ප්‍රමාද වීම සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල වගකීමට බැදී නොසිටීම.

IV. මහපොළ ශිෂ්‍යත්ව වාරික ගෙවීම් සඳහා අවශ්‍ය මුදල් විශ්වවිද්‍යාලයේ පුනරාවර්ථන වියදම් සඳහා වන මුදල් වලින් වැය නොවීම නිසා විශ්වවිද්‍යාල වල මුදල් ප්‍රවාහවලට බලපෑමක් ඇති නොවීම.

V. ලබා නොගත් වාරික මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත හරවා එවීමේ කටයුතු විශ්වවිද්‍යාලයෙන් බැහැරවීම.

VI. ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා යන අතිරේක වියදම් වශයෙන් මුද්‍රණ වියදම්, ප්‍රවාහන වියදම්, නිලධාරීන්ගේ ගමන් වියදම් සියලුම දේ ඉතිරිවේ. (සියලුම නිර්දේශිත නාම ලේඛණ හා ගෙවීම් නිර්දේශ විද්‍යුත් තැපැල මඟින් ලබා ගන්නා නිසා)

අවසන් වශයෙන් මෙම නව ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක වීමේදි පහත සඳහන් ගෙවීම් වාර්තා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මගින් ඒ ඒ විශ්වවිද්‍යාලවලට හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉතා කඩිනමින් (ගෙවීම් කළ වහාම) ලබාදීමට කටයුතු කරනු ඇත.

I. ශිෂ්‍යත්වලාභියාට මුදල් බැංකු ගිණුම වෙත බැර කල විගස අදාල ශිෂ්‍යත්වලාභියාට කෙටි පණිවිඩයක් (SMS) මගින් දැනුම් දීම.

II. අදාල මාසයේ නිර්දේශිත නාමලේඛණයට අදාලව මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් ගෙවීම් වලට සම්බන්ධ වවුචරය හා බැංකුව විසින් ලබාදෙන ගෙවීම් සහතිකයේ පිටපත් ඒ ඒ විශ්ව විද්‍යාල වෙත යැවීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීම.

III. සෑම වර්ෂයක් අවසානයේදීම එම වර්ෂවලට අදාල ගෙවීම් ලේඛණවල සාරාංශයක් හා වාර්තාවක් සියලුම විශ්වවිද්‍යාල වෙත යැවීම.